**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු සංඛ්‍යාවන් භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයේ සඳහන් සංඛ්‍යා සමඟ එකඟ විය යුතුව තිබුණි. නමුත් රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා කුලී හා වැඩ අත්තිකාරම් ලැබීම්වල එකතුව ලෙස රු.19,876,260 ක් දක්වා තිබුණි. භාණ්ඩාගාර අවසන් ගිණුම් සාරාංශ අනුව එම වටිනාකම රු.14,028,679 ක් වී තිබුණි. ඒ අනුව රු.5,847,581 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ලබාදුන් ආකෘති පත්‍රවලට අනුව 2018 මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද අතර, ඒ ඒ ආකෘති පත්‍ර වලදී අගයන් ලබාගත යුතු ආකෘතීන් වල විස්තර පැහැදිලිව දක්වා තිබුණි. ඒ අනුව කුලී වැඩ අත්තිකාරම් ගිණුමේ 2018.12.31 දිනට ශේෂය වූ රු.8,644,740.00 වූ වත්කම් ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් ලෙස දක්වන ලදි . එමෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ලබා දුන් ආකෘති පත්‍රවල උපදෙස් පරිදි එම අගය (ඒ.සී.ඒ.S.(ඒ)) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ද ආදායම් නොවන ලැබීම් හා ආදායම් නොවන ගෙවීම් ලෙස දක්වා ඇති බව තවදුරටත් දන්වා සිටිමි.<br>පවත්නා වර්ෂයේ ප්‍රතිපාදන මත 2104 වැය විෂයයෙන් වැඩ ආරම්භ කල මීගමුව නව කාර්යාලය ඉදිකිරීම් නිසි පරිදි ගෙවීම් කිරීමට නොහැකිවීම අවසන් කිරීමට නොහැකි විය .නමුත් ඒ සඳහා වැඩ කුලී අත්තිකාරම් මුදල එම වර්ෂයේ දීම අයකර ගතවූ මුදලකි. |
| (ආ) | ඉහත චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව අත්තිකාරම් ගෙවීම් ලෙස රු.26,118,292 ක් දැක්විය යුතු වුවත් එය රු.24,021,132 ක් ලෙස රු.2,797,160 ක් අඩුවෙන් දක්වා තිබුණි. | - ඉහත පරිදි - | |
| (ඇ) | ගමන් වියදම් රු.11,741,093 | වියදම් නිවැරදි ලෙස | දිවයින වටා වෙරළ තීරයේ කෙරෙන |

| | | |
|---|---|---|
| ක් හා අතිකාල වියදම් රු.6,163,486 ක් වශයෙන් එකතුව රු.17,904,579 ක් වූ පුනරාවර්තන වියදම්, මූලධන වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම | සංවර්ධන වැඩ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව නිලධාරීන් හා සේවකයින් යෙදවීමේදී වාර්ෂිකව සැලකිය යුතු මුදලක් (රු.මි20.-25) අතිකාල හා ගමන් වියදම් වශයෙන් දැරීමට සිදුවන නමුත් මෙම පිරිවැය ආවරණය කිරීමට අතිකාල හා දේශීය ගමන් වියදම් වැය විෂයයන්ගේ ප්‍රතිපාදන කිසිසේත් ප්‍රමාණවත් නොවේ.<br><br>වැඩබිම් වල පිහිටීම හා සංවර්ධන කාර්යයන් හි ස්වභාවය සැලකීමේ දී ඒ වෙනුවෙන් නිලධාරීන් හා සේවකයින් බැහැර හා අතිකාල සේවයේ යෙදවීම නොවැලැක්විය හැකිවීමත්, ඒ වෙනුවෙන් වූ වියදම උද්ගත වන්නේ ප්‍රාග්ධන ස්වරූපයෙන් වූ සංවර්ධන වැඩ හේතුවෙන් වීමත්, යන යුක්ති සහගත හේතූන් මත මෙම අතිකාල හා ගමන් වියදම් අංක 2509 යන ප්‍රාග්ධන වැය විෂයය මඟින් ගෙවීමට කටයුතු කර ඇත. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුළු තැන්පත් ලැබීම් හා ගෙවීම් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | |
| (ආ) අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයේ ඇතුළත් කර නොතිබුණි. | - ඉහත පරිදි - | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදී | - ඉහත පරිදි - | |

නොතිබුණත්, ඒ යටතේ වන තැන්පත් ගිණුම් හා අනෙකුත් වලකීම්වල වෙනස්වීම් වශයෙන් රු.41,122,025 ක් දක්වා තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව එළඹ තිබුණ බැරකම්වල වටිනාකම රු.60,306,419 ක් වී තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල එම බැරකම් ප්‍රමාණය රු.8,027,750 කින් අඩුකර රු.52,278,669 ක් ලෙස දක්වා තිබුණි. | වර්ෂය අවසාන වන විට එළඹ තිබූ බැරකම් ප්‍රමාණය නිවැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කළ යුතුවීම. | 2018.12.31 දිනට බැරකම් (ලැබී තිබුණ බිල්පත්) වල එකතුව රු.52,278,669 ක් වන අතර 2019 මුල් කාර්තුව තුළ කරන ලද ගෙවීම්වලට එම බැරකම්වලට අමතරව 2018.12.31 දිනට ඉතිරි වී තිබූ බැදීම් ශේෂය රු.65,771,281.79 න් රු.8,027,750 ක පමණ ප්‍රමාණයක් ද ගෙවීම් කර ඇත. එම රු.8,027,750 ට බිල්පත් 2018.12.31 දිනට ලැබී නොමැති බැවින් ඒවා බැරකම් ලෙස නොව බැදීම් ලෙස දක්වා ඇත. |

**2.2 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුම්වල වර්ෂ 2 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.3,719,010 ක්වූ තැන්පතු ශේෂ පැවැතුණි. 2019 මැයි 31 දින වන විටත් එම | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු විම. | ගෙවීම් කර පියවීමට කටයුතු කරමින් පවතී. |

තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර ආදායමට හෝ පියවීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ පහත සඳහන් අවශ්‍යතාවයන් ඉටුකර නොතිබුණි.<br><br>(i) යාවත්කාලීන කළ සංවිධාන ව්‍යුහය<br><br>(ii) අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර | 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | සංවිධාන ව්‍යුහය හා කාර්ය මණ්ඩල විස්තර ඉදිරිපත් කර ඇත. |

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 1,024.5 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘති 13 අතරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර | ව්‍යාපෘති සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කර උපරිම භෞතික ප්‍රගතියක් ලබා කර ගත යුතු විම. | බාහිර සාධක හේතුවෙන් අපේක්ෂිත පරිදි කටයුතු කිරීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| නොතිබුණි. ක්‍රියාත්මක කර තිබූ අනෙක් ව්‍යාපෘති 12 හි භෞතික ප්‍රගතිය සියයට 12 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. එම ව්‍යාපෘති 12 හි මූල්‍ය ප්‍රගතිය සියයට 29 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක තිබුණි. සමස්ත ප්‍රතිපාදනයේ සියයට 86 ක් හෙවත් රු.මිලියන 890.29 ක් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | | |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් වෙරළ සංරක්ෂණ වැඩසටහන් සහ අනවසර ඉදිකිරීම් සිදු නොවන පරිදි කටයුතු කළ යුතුව තිබුණි. නමුත් 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා හඳුනාගත් අනවසර ඉදිකිරීම් සංඛ්‍යාව 1764 ක් වී තිබුණි. එම අනවසර ඉදිකිරීම් කඩා ඉවත්කිරීම් සඳහා නියෝග 1615 ක් ලබා ගෙන තිබුණි. නමුත් කඩා ඉවත් කිරීම් ප්‍රමාණය 215 ක් වී තිබුණු අතර එය කඩා ඉවත් කල යුතු ප්‍රමාණයෙන් සියයට 13 ක් වැනි අඩු කාර්යසාධන මට්ටමක් වී තිබුණි. | හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම්වල ස්වභාවය අනුව වර්ග කර හැකි ඒවා කඩා ඉවත් කිරීමට සැලැසුම් කර අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කළ යුතු විය. | එම ස්ථාන සඳහා විකල්ප ස්ථාන ලබා දීමට නොහැකිවීම සහ සමාජ හා දේශපාලන බලපෑම් නිසා මෙසේ කඩා ඉවත්කිරීම් ප්‍රමාද වීමට හේතු වී තිබුණි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නොරොච්චෝලේ - ඉලන්තඩිය ග්‍රොයින ශ්‍රේණිය ඉදිකිරීමේ මූලික පිරිවැය ඇස්තමේන්තුවට | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන | නොරොච්චෝලේ - ඉලන්තඩිය ග්‍රොයින ඉදිකිරීමේ වැඩබිමට අදාල |

| | | | |
|---|---|---|---|
| | අනුව වියදම රු.මිලියන 35.5 ක් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව එහි මූලික පිරිවැය ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමත කර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූලික පිරිවැය ඇස්තමේන්තුව සකස් කර ඇති අතර අතපසුවීමකින් අදාළ ඇස්තමේන්තුව ආයතන ප්‍රධානියා විසින් අනුමත කර නොමැති අතර, සංශෝධනය කරන ලද පිරිවැය ඇස්තමේන්තුවක් පසුව සකස්කර එය ආයතන ප්‍රධානියා විසින් අනුමත කර ඇත. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම්වලින් රඳවා ගෙන ඇති මුදලින් කොන්ත්‍රාත්තුව නිම කළ පසු හර අඩක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඉතිරිය දෝෂ වගකීම් කාලය අවසන් වන තුරු රඳවාගත යුතුව තිබුණි. නමුත් එසේ රඳවාගත් මුළු මුදලම කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු මුළුමණින්ම ගෙවා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. | සැපයුම්කරුගේ සැපයුම විධිමත් පරිදි දෙපාර්තමේන්තුව මගින් භාර ගන්නා ලද පසුව අදාළ සැපයුම පිළිබඳව වගකීමෙන් සැපයුම්කරු නිදහස් වේ. එබැවින් සැපයුම සම්පූර්ණයෙන් අවසන් කළ පසු අදාළ රැඳවුම් ගාස්තු සැපයුම්කරු වෙත ගෙවා ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් රු.5,116,500 ක්වූ සැපයුම් සිදු කර තිබුණත්, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(අ) හා 5.4.9 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි. | - ඉහත පරිදි - | වෙරළාරක්ෂක ඉදිකිරීම්වලදී යන්ත්‍රෝපකරණ හා බර වාහන කුලී පදනම මත සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා අතර, දෙපාර්තමේන්තුව එවැනි සැපයුම්කරුවන්ගෙන් කාර්යසාධන සුරක්ෂිත මුදලක් ලබා ගැනීම සිදුකර නොමැත. එහෙත් මෙම වර්ෂයේ සිට යන්ත්‍ර හා බර වාහන සැපයුම්වලදී මෙම කාර්ය සපුරාලීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් බරවාහන හා යන්ත්‍රෝපකරණ සැපයීම් සඳහා රු.මිලියන 8.1 ක් වැය කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් | - ඉහත පරිදි - | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ද්‍රව්‍ය සැපයුම් සඳහා ගිවිසුම්වලට ඇතුළත් වන අතර යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් ගිවිසුම්ගතවීමේදී ඇතිවන ප්‍රායෝගික දුෂ්කරතා නිසා |

| | | |
|---|---|---|
| ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | | සිදුකරනු නොලැබූ අතර මෙම වසරේ සිට ගිවිසුම්ද සකස්කර ගිවිසුම්ගත වීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වී තිබුණු විනාශ කළ යුතු භාණ්ඩ අයිතම 70ක් ද, අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අයිතම 06ක් සහ විකිණීම සඳහා නිර්දේශ කල භාණ්ඩ අයිතම 258 ක් සම්බන්ධයෙන් 2017 මැයි 31 දිනැති අංක 2017/04 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2017 මැයි 31 දිනැති අංක 2017/04 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී වෙරළ ආශ්‍රිතව සිදු කරනු ලබන ඉදිකිරීම් සඳහා අවසර බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලුම් කිරීමේ ලිපිගොනු 2384 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූණු අතර එම ලිපිගොනුවලින් බලපත්‍ර 1884 ක් නිකුත් කර තිබුණි. ඉතිරි ලිපිගොනු 500 වෙනුවෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවිම. | බලපත්‍ර ලබා දීමේ අවශ්‍යතා /නිර්ණායක සපුරාලිය නොහැකි අයදුම්පත් සඳහා බලපත්‍ර ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබයි. එවන් අවස්ථා ලෙස සමහර අයදුම්පත් බලපත්‍ර ලබා දීමේ අවශ්‍යතා සම්පූර්ණ නොවීම හා අයදුම්පත් පරීක්ෂාවේ දී එම ඉදිකිරීම් වෙරළ කළාපයෙන් බැහැරව පිහිටා තිබීම දැක්විය හැකිය. ඒ අනුව ලියාපදිංචි කරන ලද සියලු අයදුම්පත් |

සඳහා බලපත්‍රයක් නිකුත් නොකරන බව දැන්විය හැකිය.